# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2115/7 - 2019 මාර්තු මස 18 වැනි සඳුදා - 2019.03.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය :- සාගි/වතු/01/2019

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

එක් පාර්ශ්වයක් වශයෙන් රාජගිරිය, පරණ කෝට්ටේ පාර, අංක 385 J3 හි පිහිටා ඇති ලංකා සේවා සම්මේලනය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවත, අංක 72 හි පිහිටා ඇති ලංකා කම්කරු කොන්ග්‍රසය සහ රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවත, බණ්ඩාරනායකපුර, අංක 60 හි පිහිටා ඇති ලංකා ජාතික වතු සේවක සංගමය අතර 2019 ජනවාරි මස 28 වන දින ඇති කරගන්නා ලද සාමූහික ගිවිසුම් පත්‍රය ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 06 වන වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 13 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

2019 අංක 03 දරන සාමූහික ගිවිසුම

### 2019 - 2021 - වතු කම්කරුවන්ගේ වැටුප් පිළිබඳ සාමූහික ගිවිසුම

මෙම සාමූහික ගිවිසුම රාජගිරිය, පරණ කෝට්ටේ පාර, අංක 385J3 යන ලිපිනය ලියාපදිංචි ලංකා හාම්පුතුන්ගේ සංගමය (මෙහි මින්මතු ''පළමු පාර්ශ්වය'' යනුවෙන් හඳුන්වනු ලබන සහ සාමාජික සමාගම් යනුවෙන් හඳුන්වනු ලබන නාම ලේඛනය උපලේඛනයෙහි අමුණා ඇත.) එක් පාර්ශ්වයක් වශයෙන් ද, කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවතේ, අංක 72 යන ලිපිනයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන සිලෝන් වර්කර්ස් කොංග්‍රසය, රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවත, බණ්ඩාරනායකපුර, අංක 60 ලිපිනයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන ලංකා ජාතික වතු කම්කරුවන්ගේ සංගමය දෙවන පාර්ශ්වය වශයෙන් (මෙහි මින්මතු දෙවන පාර්ශ්වය ඒකාබද්ධ සහ වශයෙන් හැඳින්විය හැකිය) පහත දැක්වෙන කරුණු සඳහා දෙපාර්ශ්වය එකඟවෙමින් බැඳෙන ගිවිසුමයි.

2016 ඔක්තෝබර් මස 18 වෙනි දින ඇතුළත් වූ වැටුප් පිළිබඳ සාමූහික ගිවිසුම සංශෝධනය කිරීමට පාර්ශ්වයන් අතර සාකච්ඡාවට ගනු ලැබිය. (2016 අංක 35 දරන සාමූහික ගිවිසුම). 2019 ජනවාරි මස 28 වෙනි දින සිට ක්‍රියාත්මක වන වැටුප් සහ අනිකුත් අදාළ ගෙවීම් වෙනුවෙන් මෙහි පහත ගිවිසගෙන ඇති පරිදි පාර්ශ්වයන් විසින් සහ ඔවුන් වෙනුවෙන් එකඟ වී ඇති සංශෝධිත නියමයන් එවැනි කාලයක් දක්වා සුදුසු ලෙස එකී පාර්ශ්වයන් විසින් සැලකිල්ලට ගනු ඇත.

1. ධාරිතා අනුව ගෙවීමේ දෛනික අනුපාතය මත වැඩ කරන සේවකයින් මෙය බලපැවැත්වෙන දින සිට පහත දැක්වෙන පාරිතෝෂික පැකේජය ලබා ගත යුතු ය.

අ. තේ

i. දෛනික වැටුප රු. 700 - මත සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්ති භාරකාර අරමුදල් ප්‍රතිලාභ ගෙවිය යුතු ය.

ii. මූලික වැටුප 40% කින් සංශෝධනය කිරීම පිණිස පළමු පාර්ශ්වයේ කණ්ඩායම විසින් ගනු ලැබූ තීරණය පෙරදැරි කොට ගෙන සේවකයාට අදාළ කොන්දේසි සහ නියමයන්හි කොටසක් ලෙස පැමිණීමේ දිරිදීමනා සහ නිෂ්පාදන දිරිදීමනා වෙනුවට ගෙවනු



මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ලබන ගෙවීම් සැලකිල්ලට නොගන්නා බවට සහ ඒ අනුව මෙම ගිවිසුමෙන් ආවරණය වන සහ බැඳෙන සේවකයින් මෙහි දක්වා ඇති ගෙවීම්වලට අමතරව වෙනත් කිසිදු ගෙවීමක් ලැබීමට සුදුසුකම් නොලබන බව දෙවන පාර්ශ්වයේ කණ්ඩායම එකඟ වේ.

iii. දිනකට රු. 50/- ස්ථාවර මිල කොටස් අතිරේකයක් වේ.

iv. තේ කිලෝවක උපරිම මිල රු. 40/- කි.

v. ඉහත iii සහ iv හි සඳහන් කරන ලද ගෙවීම ඒ මත සේ.අ.අ. හා සේ. නි. අ. ආදී කිසිදු ප්‍රතිලාභ මුදලක් ගෙවීම සඳහා සේවකයකුගේ ඉපයීම් කොටස් බවට පත් නොවේ.

vi. ඉරිදා දිනක වැඩ කිරීම සඳහා මූලික දෛනික වැටුප වන රු. 700/- මෙන් 1 1/2ක් ද දිනකට රු. 50/- ස්ථාවර මිල කොටස් අතිරේකය මෙන් 1 1/2 ක් ද සේව්‍ය පාර්ශ්වය විසින් ගෙවිය යුතු වේ.

ආ. රබර්

i. දෛනික වැටුප රු. 700 - මත සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්ති භාරකාර අරමුදල් ප්‍රතිලාභ ගෙවිය යුතු ය.

ii. මූලික වැටුප 40% කින් සංශෝධනය කිරීම පිණිස පළමු පාර්ශ්වයේ කණ්ඩායම විසින් ගනු ලැබූ තීරණය පෙරදැරි කොට ගෙන සේවකයාට අදාළ කොන්දේසි සහ නියමයන්හි කොටසක් ලෙස පැමිණීමේ දිරිදීමනා සහ නිෂ්පාදන දිරිදීමනා වෙනුවට ගෙවනු ලබන ගෙවීම් සැලකිල්ලට නොගන්නා බවට සහ ඒ අනුව මෙම ගිවිසුමෙන් ආවරණය වන සහ බැඳෙන සේවකයින් මෙහි දක්වා ඇති ගෙවීම්වලට අමතරව වෙනත් කිසිදු ගෙවීමක් ලැබීමට සුදුසුකම් නොලබන බව දෙවන පාර්ශ්වයේ කණ්ඩායම එකඟ වේ.

iii. දිනකට රු. 50/- ස්ථාවර මිල කොටස් අතිරේකයක් වේ.

iv. රබර් කිලෝවක උපරිම මිල රු. 45/- කි.

v. ඉහත iii සහ iv හි සඳහන් කරන ලද ගෙවීම ඒ මත සේ. අ. අ හා සේ. නි. අ. ආදී කිසිදු ප්‍රතිලාභ මුදලක් ගෙවීම සඳහා සේවකයකුගේ ඉපයීම් කොටස් බවට පත් නොවේ.

vi. ඉරිදා දිනක වැඩ කිරීම සඳහා මූලික දෛනික වැටුප වන රු. 700/- මෙන් 1 1/2 ක් ද දිනකට රු. 50/- ස්ථාවර මිල කොටස් අතිරේකය මෙන් 1 1/2 ක් ද සේව්‍ය පාර්ශ්වය විසින් ගෙවිය යුතු වේ.

ඇ. අයිතම 1අ සහ 1ආ හි දැක්වෙන නියමයන්ට අනුව සඳහන් කොට ඇති ගෙවීම්වලට අමතරව වෙනත් කිසිදු ගෙවීමක් සිදුනොකරනු ඇත.

2. ඉහත 1 වගන්තිය යටතේ නියම කොට ඇති පරිදි පාරිශ්‍රමික පැකේජය වලංගු වන්නේ සහ අදාළ වන්නේ 2019 ජනවාරි මස 28 වෙනි දිනෙන් ආරම්භවී අවම වශයෙන් වර්ෂ දෙකක (02) කාලයකට බවටත් ඉන් පසුව එය කිසියම් පාර්ශ්වයක් විසින් අහෝසි නොකළහොත් සහ එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වයට එක් මසක (01) ලිඛිතව දැනුම්දීමෙන් පමණක් අඛණ්ඩව බලාත්මක වන බවටත් පාර්ශ්වයන් එකඟ වේ. තවදුරටත්, පාර්ශ්වයන් දෙකින් එක් පාර්ශ්වයක් විසින් හෝ සේවකයින්ට වර්තමානයේ අදාළවන මෙම පාරිශ්‍රමික පැකේජයට හෝ වෙනත් ඕනෑම ඍජු මුදල්මය ගෙවීම්වලට සිදුකරනු ලබන ඕනෑම ආකාරයක යම් එකතු කිරීමක්, එසේ එකතු කිරීමට උත්සාහ කිරීමක්, වෙනස් කිරීමක් හෝ විකෘති කිරීමක් හේතුකොට ගෙන මෙම ගිවිසුම සමාප්ත වනු ඇත.

3. වෘත්තීය සමිතිය, ඊළඟ ගිවිසුමට පෙර ආදායම් බුක්තිවිඳීම/පදවි මට්ටම් මාදිලිය ආදිය පදනම් කරගත් ඵලදායිතාවය සම්බන්ධ වේතන තන්ත්‍රයකට තනතුරු මට්ටමින් ගමන් කිරීම මගින් කර්මාන්තයේ ඵලදායිතාවයේ වැඩිදියුණුව උදෙසා සහයෝගය දැක්වීමට පොරොන්දු වේ. මෙම අරමුණ ක්‍රියාවෙහි යෙදවීමේ කාර්යය පිණිස සහ ඉහත දක්වූ කරුණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රකාරතාව පිළිබඳව සාකච්ඡා කිරීමට මෙම ගිවිසුමේ කාලපරිච්ඡේදය තුළ මාස හයක් (06) ඇතුළත හමුවී සාකච්ඡා කිරීමට පාර්ශ්වයන් එකඟ වේ.

4. වෙනස් කොට නොසලකමින්, වැඩ සඳහා සමාන වටිනාකමක් ලබාදීමට වගබලාගැනීම පිණිස පිරිමි සහ ගැහැණු දෙපාර්ශ්වයේම ප්‍රතියමානයන්ට සම්බන්ධ ගෙවීම්, ගැහැණු පාර්ශ්වය සඳහා තේ දළු නෙලීම සහ පිරිමි පාර්ශ්වය කාර්යයන් ඉටුකිරීම යන කරුණු දෙක සැලකිල්ලට ගෙන සිදුකරනු ඇත. දැනට සිදුකරනු ලබන ගෙවීම්වල ප්‍රතියමානයන්ට අදාළ කරගනිමින් උසස් කොට සැලකීමක් සිදුනොකරනු ඇත.

5. මෙම ගිවිසුමට පාර්ශ්වයන් ඇතුළත් වන්නේ 2013 අංක 13 දරන සාමූහික ගිවිසුමේ 6 වෙනි වගන්තියට අනුකූලව වන අතර, එකී ගිවිසුම නැවත සාකච්ඡාවට ගනු ලබන අවස්ථාවක් දක්වා එමගින් ගිවිසගත් ප්‍රතිපාදනයන් මෙම ගිවිසුමෙන් ආවරණය කරනු ලබන කරුණු උදෙසා හැර විශේෂයෙන් 3 වෙනි වගන්තියේ දැක්වෙන ප්‍රතිපාදනයන්ද ඇතුළුව ය.

6. මෙම ගිවිසුමේ දැක්වෙන ප්‍රතිපාදනයන් විසින් 2016 අංක 35 දරන වතු කම්කරුවන්ගේ වේතන සාමූහික ගිවිසුමේ දැක්වෙන ප්‍රතිපාදනයන් අවලංගු කොට ප්‍රතිස්ථාපනය කරනු ලබයි.

7. වතුවල කාර්යක්ෂමතාවය, ඵලදායිතාවය සහ වැඩිදියුණුව උදෙසා කැපවීමෙන් යුතුව සහායෝගයෙන් කටයුතු කරන බවට පාර්ශ්වයන් නැවතත් එකඟ වන අතර, වතු මට්ටමින් සමගි සම්පන්නව තව තවත් සාකච්ඡා කිරීමට සහ ගැටළු නිරාකරණය කිරීමට අනුබල දීමට එකඟ වේ.

8. RPC වරු පරිශ්‍ර නඩත්තු කටයුතු සහ එහි පිරිසිදු බව අඛණ්ඩව පවත්වාගත යුතු වන්නේ ය.

2019 ජනවාරි මස 28 වන දින කොළඹ දී මෙයටත් තවත් ලියවිලි දෙකකටත් දෙපාර්ශ්වය අත්සන් තබන ලදී.

| | |
|---|---|
| අත්/අපැහැදිලියි<br>ඒ සිවරාජා මිය<br>මහ ලේකම්<br>ලංකා කම්කරු කොංග්‍රසය | අත්/අපැහැදිලියි<br>භාතිය බුලුමුල්ල<br>උප සභාපති<br>වතු සේවා මණ්ඩලය<br>ලංකා හාම්පුතුන්ගේ සංගමය |
| අත්/අපැහැදිලියි<br>ඒ වඩිවේල්<br>ලංකා ජාතික වතු කම්කරු සංගමය | අත්/අපැහැදිලියි<br>කේ. වීරසිංහ<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ලංකා හාම්පුතුන්ගේ සංගමය |
| අත්/අපැහැදිලියි<br>එස්. රාමනාදන්<br>ඒකාබද්ධ වතු වෙළඳ සංගම් මධ්‍යස්ථානය | |

සාක්ෂිකරුවන්

අත්/අපැහැදිලියි
සුනිල් පොහොලියද්ද
සභාපති
ලංකා වැවිලිකරුවන්ගේ සංගමය

අත්/අපැහැදිලියි
ඒ තොන්ඩමන්
සභාපති
ලංකා කම්කරු කොංග්‍රසය

අත්/අපැහැදිලියි
විරේන් රුබේරු
CEO කහවත්ත ප්ලාන්ටේෂන් පුද්ගලික සමාගම

අත්/අපැහැදිලියි
පී නවරත්න
කර්මාන්ත උපදේශක
ලංකා ජාතික වතු කම්කරු සංගමය

අත්/අපැහැදිලියි
කේ. මාරිමුත්තු
උප සභාපති
ලංකා කම්කරු කොංග්‍රසය

අත්/අපැහැදිලියි
එස්. පී. විජේකුමාරන්
ජාතික සංවිධායක
ලංකා ජාතික වතු කම්කරු සංගමය

*උපලේඛනය*

1. අගලවත්ත වැවිලි සමාගම
2. ආගරපතන වැවිලි සමාගම
3. බලංගොඩ වැවිලි සමාගම
4. බොගවන්තලාව වැවිලි සමාගම
5. ඇල්කඩුව වැවිලි සමාගම
6. ඇල්පිටිය වැවිලි සමාගම
7. හපුගස්තැන්න වැවිලි සමාගම
8. හොරණ වැවිලි සමාගම
9. කහවත්ත වැවිලි සමාගම
10. කෑගල්ල වැවිලි සමාගම
11. කැලණි වැලි වැවිලි සමාගම
12. කොටගල වැවිලි සමාගම
13. මඩුල්සිම වැවිලි සමාගම
14. මල්වත්තවැලි වැවිලි සමාගම
15. මස්කෙළිය වැවිලි සමාගම
16. මතුරට වැවිලි සමාගම
17. නමුණුකුල වැවිලි සමාගම
18. පුස්සැල්ල වැවිලි සමාගම
19. තලවකැලේ වැවිලි සමාගම
20. උඩපුස්සැල්ලාව වැවිලි සමාගම
21. වටවල වැවිලි සමාගම
22. හැටන් වැවිලි සමාගම

04 - 20